වයඹ පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තුමේන්තුවේ පවුල් සෞඛ්‍ය සේවා නිලධාරී බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය.

1. **සම්බන්ධ වන ආයතන**

1.1 දෙපාර්තමේන්තුව : වයඹ පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව

යොමු අංකය : NWP/PDHS/E6/PHM/02 දිනය :……………..

1.2 තනතුර අයත් අමාත්‍යාංශය: වයඹ පළාත් සෞඛ්‍ය විෂයභාර අමාත්‍යාංශය

යොමු අංකය : N.W.P/M.H/E.24/2013 දිනය : 2019/11/05

1.3 කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුරු අනුමත කිරීම:

යොමු අංකය : DMS/B/පොදු /11-2 දිනය : 2012.12.19

1.4 ප්‍රධාන ලේකම්ගේ නිර්දේශය :

යොමු අංකය : N.W.P/CS/AD/9/H/1-14 දිනය : 2019/11/07

1.5 වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිර්දේශය:

යොමු අංකය : PPSC/AD15/1/6/1/2019 දිනය : 2019.10.16

1.6 වයඹ පළාත් ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය:

යොමු අංකය : NWP/Gov/AD3/19/2/39 දිනය : 2019.12.30

1.7 ක්‍රියාත්මක දිනය - වයඹ පළාත් ගරු ආණ්ඩුකාරතුමා අනුමත කළ දිනය වේ.

පවුල් සෞඛ්‍ය සේවා නිලධාරීන් බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය

2019.12.30

වයඹ ආණ්ඩුකාරවර ලේකම්

දිනය: 2019.12.31

2. **පත් කිරීම් බලධරයා**

වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව

3. **සේවා ගණය පිළිබඳ විස්තර**

3.1 සේවා ගණය : අතුරු වෛද්‍ය සේවාව - 02 ඛණ්ඩය

3.2 ශ්‍රේණි : III, II, I, අධි ශ්‍රේණිය

3.3 පැවරෙන කාර්ය භාරය පිළිබඳ පොදු නිර්වචනය :

පූර්ව ප්‍රසව සංරක්ෂණය , අන්තර් ප්‍රසවය හා පසු ප්‍රසව සංරක්ෂණය යන තේමාවන් තුල ගුණාත්මකවූත්, සානුකම්පිතවූත් සේවාවක් සපයමින් මාතෘ හා ළමා සෞඛ්‍ය සංවර්ධනය මූලික කොට සෞඛ්‍ය අධ්‍යාපනය ලබාදීම.

3.4 කාර්යයන් පැවරීම :

ශ්‍රේණිගතව කාර්යයන් පැවරීමක් සිදු නොකරන අතර,මෙම සේවා ගණයට පැවරෙන කාර්යයන් අතුරින් ඕනෑම කාර්යයක් සේවයේ අවශ්‍යතාවය මත ජ්‍යෙෂ්ඨතාව හා කුසලතාව පදනම් කොට ගෙන ඕනෑම ශ්‍රේණියක නිලධාරිනියකට දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් පවරනු ලැබිය හැක .

4. **තනතුරෙහි/තනතුරුවල ස්වභාවය :** මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය.

සටහන : විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයට යටත් විය යුතුය.

5. වැටුප්

5.1 සේවා ගණයට අදාල වැටුප් කේත අංකය : MT 5-2016

5.2 වැටුප් පරිමාණය : රු.31,635-10 x 445-11x 660-10 x 730-10 x 750 - රු.58,145

5.3 සේවා ගණයට අදාල ශ්‍රේණි ක්‍රමය හා ශ්‍රේණි ක්‍රමයට අදාල මාසික වැටුප් පියවර :

| ශ්‍රේණිය | අදාල ආරම්භක වැටුප් පියවර | |
|---|---|---|
| III | පියවර 01 | රු.31,635/- |
| II | පියවර 12 | රු.36,745/- |
| I | පියවර 23 | රු.44,075/- |
| අධි | පියවර 32 | රු.50,645/ |

පවුල් සෞඛ්‍ය සේවා නිලධාරීන් බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය

2019. 12-30

දිනය: 2019. 12- 31

6. සේවා ගණයට අයත් තනතුරු

6.1 අනුමත තනතුරු නාම,අනුමත තනතුරු සංඛ්‍යාව හා ඒවාට පැවරෙන කාර්යයන් :

| අනුමත තනතුරු නාම | අනුමත තනතුරු සංඛ්‍යාව | කාර්යයන් |
|---|---|---|
| පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනී | 989<br>III/II ශ්‍රේණිය | (අ).මාතෘ හා ළමා සෞඛ්‍ය සංවර්ධනය මූලික කොට ඇති සෞඛ්‍ය අධ්‍යාපනය ලබාදීම, ප්‍රාථමික සෞඛ්‍ය ප්‍රවර්ධනය හා සම්බන්ධ සියලු රාජකාරි.<br><br>මේ අනුව එළඳායී පවුල් හඳුනා ගැනීම, පූර්ව ප්‍රසව සංරක්ෂණය, ප්‍රසව සංරක්ෂණය, දරු ප්‍රසූතියේ දී මවගේත්, නව ජන්මයාගේත් පූර්ණ ආරක්ෂාව සැලසෙන පරිදි ප්‍රසූතිය සම්පූර්ණ ලෙස සිදු කිරීම, පසු ප්‍රසව සංරක්ෂණය, පවුල් සැලසුම් කටයුතු, මන්දපෝෂණය වැලැක්වීමට ක්‍රියා කිරීම,බර අඩු ළදරුවන්ගේ වර්ධනයෙහිලා පියවර ගැනීම වශයෙන් ළදරු, ළමා ප්‍රතිශක්තිකරණ කටයුතු,බෝවන රෝග අරහයා එන්නත් දීම වැනි සියළු කටයුතු. |
| | I ශ්‍රේණිය,<br>අධිශ්‍රේණිය | (ආ).ඉහත (අ) හි සඳහන් කාර්යන්ට අමතරව පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිණී,අධීක්ෂණ කටයුතු හා ක්ෂේත්‍ර පුහුණුවේ දී සිසු පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනීන් අධීක්ෂණය . |
| පරිපාලන පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනී | 43 | ඉහත (අ), (ආ) හි සඳහන් කාර්යයන්ට අමතරව පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනී අධීක්ෂණ කටයුතු හා ක්ෂේත්‍ර පුහුණුවේ දී සිසු පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනීන් අධීක්ෂණය . |

6.2 ඒකාබද්ධ නිළධර සංඛ්‍යාව :

| තනතුරු නාම | තනතුරු සංඛ්‍යාව |
|---|---|
| පවුල් සෞඛ්‍ය සේවා නිළධාරිනි | 989 |
| පරිපාලන පවුල් සෞඛ්‍ය සේවා නිළධාරිනි | 43 |

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය මත අනුමත තනතුරු සංඛ්‍යාව වෙනස් විය හැක . ශ්‍රේණියෙන් ශ්‍රේණියට උසස් කිරීමේ කාර්ය සඳහා III, II, I හා අධි ශ්‍රේණීන් සියල්ල ඒකාබද්ධ නිළධර සංඛ්‍යාව සේ සැලකේ.

පවුල් සෞඛ්‍ය සේවා නිලධාරීන් බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය
2019. 12. 30
ලේකම්
දිනය: 2019. 12. 31

7. බඳවා ගැනීම

7.1 බඳවා ගන්නා ප්‍රතිශතයන් :

| ධාරාව | ප්‍රතිශතය |
|---|---|
| විවෘත | 50% |
| සීමිත | 50% |

සටහන : සීමිත පදනම මත ප්‍රමාණවත් අයදුම්පත් සංඛ්‍යාවක් නොලැබුණහොත් විවෘත පදනම මත එම පුරප්පාඩු ද සම්පූර්ණ කිරීමට කටයුතු කරනු ලැබේ.

7.2 විවෘත බඳවා ගැනීම :

7.2.1 බඳවා ගන්නා ශ්‍රේණිය : III වන ශ්‍රේණිය

7.2.2 සුදුසුකම් :

7.2.2.1 අධ්‍යාපන සුදුසුකම්/වෘත්තීය සුදුසුකම් :

i. සිංහල/දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයකට සම්මාන සමාර්ථ සහිතව ඉංග්‍රීසි භාෂාව ද ඇතුලුව දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයන් 06 කින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්වීම.

සහ

ii. අ.පො.ස.උසස් පෙළ විභාගයෙන් ජීව විද්‍යාව, භෞතික විද්‍යාව, කෘෂි විද්‍යාව, රසායන විද්‍යාව යන විෂයයන් අතුරින් විෂයන් තුනක් එක්වරක දී සමත්වීම.

සහ

iii. පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනී තනතුරෙහි කාර්යභාරයට අදාලව සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය මඟින් මෙහෙයවනු ලබන වසර එකහමාරක පූර්ණකාලීන වෘත්තීයමය ඩිප්ලෝමා (අභ්‍යන්තර) පාඨමාලාව සාර්ථකව හදාරා ඩිප්ලෝමා සහතික ලබා තිබිය යුතුය.

7.2.2.2 කායික සුදුසුකම් :

i. සෑම අපේක්ෂිකාවක්ම වයඹ පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුයි.

ii. උස අඩි 4 යි,අඟල් 10 හෝ ඊට වැඩි විය යුතුය.

7.2.2.3 වෙනත් :

i. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

ii. අයදුම්කාරියන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනී බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටිය
[illegible] විසින්
2019.12.30 දින
අනුමත [illegible] බව
සහතික කරමි.
වයඹ ආණ්ඩු[illegible]
දිනය: 2019.12.31

7.2.3 වයස :

7.2.3.1 අවම සීමාව : අවුරුදු 18
උපරිම සීමාව : අවුරුදු 30

7.2.4 බඳවා ගැනීමේ ක්‍රමය :

රේඛීය සෞඛ්‍ය අමාත්‍යාංශය මඟින් පුහුණුව සඳහා බඳවාගෙන පත්වීම් ලබා දී වයඹ පළාත් සභාවට අනුයුක්ත කරනු ලබන නිලධාරීන් සඳහා III ශ්‍රේණියට බඳවා ගැනීමේ විධිමත් පත්වීම් ලිපිය නිකුත් කරනු ලැබේ.

7.3 සීමිත බඳවා ගැනීම :

7.3.1 බඳවා ගන්නා ශ්‍රේණිය : III වන ශ්‍රේණිය

7.3.2 සුදුසුකම් :

7.3.2.1 අධ්‍යාපන සුදුසුකම්/වෙනත් සුදුසුකම්:

i. සිංහල/දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයකට සම්මාන සාමාර්ථ සහිතව ඉංග්‍රීසි භාෂාව ද ඇතුලුව දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයන් 06 කින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්වීම.

සහ

ii. අ.පො.ස.උසස් පෙළ විභාගයෙන් ජීව විද්‍යාව,භෞතික විද්‍යාව, කෘෂි විද්‍යාව, රසායන විද්‍යාව, යන විෂයයන් අතුරින් විෂයන් තුනක් එක්වරක දී සමත්වීම.

සහ

iii. පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනී තනතුරෙහි කාර්යභාරයට අදාළව සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය මඟින් මෙහෙයවනු ලබන වසර එකහමාරක පූර්ණකාලීන වෘත්තීයමය ඩිප්ලෝමා (අභ්‍යන්තර) පාඨමාලාව සාර්ථකව හදාරා ඩිප්ලෝමා සහතික ලබා තිබීම.

7.3.2.2 පළපුරුද්ද :

වයඹ පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තුමේ දෙපාර්තුමේන්තුගත තනතුරක PL-01, PL-02, PL - 03 , MN - 01, MN -02 හෝ MN-03 වැටුප් කේත යටතේ වැටුප් ලබන තනතුරක වසර තුන (03) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතුය.

7.3.2.3 කායික හා මානසික සුදුසුකම් :

i. සෑම අපේක්ෂිකාවක්ම වයඹ පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්,තනතුරේ රාජකාරි ඉටුකිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුයි.

ii. උස අඩි 4 යි,අඟල් 10 ක් හෝ ඊට වැඩි විය යුතුය.

7.3.2.4 වෙනත්:

i. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

ii. දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට බැඳී සිටිය යුතුය .තමන් අයදුම් කරන දිස්ත්‍රික්කය තුළ සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු දිනට පූර්වාසන්න අවුරුදු තුනක් අඛණ්ඩව පදිංචි වී සිටිය යුතුය.

iii. පුහුණු පාඨමාලාවට බඳවා ගනු ලබන දිනට විශ්ව විද්‍යාලයක හෝ වෙනත් ආයතනයක පූර්ණකාලීන පාඨමාලාවක් සඳහා ලියාපදිංචි වී නොසිටිය යුතුය.

iv. අයදුම්කාරියන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

v. අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු බවට සඳහන් කරනු ලබන දිනට සියළු සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය . එමෙන්ම, අයදුම්කාරියන් විසින් සුදුසුකම් සනාථ කිරීම සඳහා අදාල සහතිකවල පිටපත් අයදුම් පත්‍රය සමඟ ඉදිරිපත් කල යුතුය.

7.3.4 වයස : අදාළ නොවේ.

7.3.5 බඳවා ගැනීමේ ක්‍රමය : මෙය සෞඛ්‍ය විෂය භාර රේඛීය අමාත්‍යාංශය මඟින් සිදු කරනු ලැබේ.

7.3.6 අයදුම්පත් කැඳවීමේ ක්‍රමය : අභ්‍යන්තර නිවේදන මඟින්

7.3.7 තනතුරට බඳවා ගැනීම :

සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය මගින් මෙහෙයවනු ලබන ඩිප්ලෝමා පුහුණු පාඨමාලාව අවසානයේදී පවත්වනු ලබන අවසන් පරීක්ෂණයෙන් ලද කුසලතා අනුපිළිවෙල අනුව අතුරු වෛද්‍ය සේවාවෙහි පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනී තනතුරට පවත්නා පුරප්පාඩු අනුව III වන ශ්‍රේණියට බඳවා ගනු ලැබේ.

**8.කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ**

8.1

| **කුමන කාර්යක්ෂමතා කඩඉමද යන වග** | **කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ පැවැත්වීම** | **කාර්යක්ෂමතා කඩඉමේ ස්වභාවය** |
|---|---|---|
| 1 වන කාර්යක්ෂමතා කඩඉම | III ශ්‍රේණියට බඳවාගෙන වසර තුන (03) ක් ගතවීමට පෙර | ලිඛිත පරීක්ෂණයකි - උපලේඛණ 1 |
| 2 වන කාර්යක්ෂමතා කඩඉම | II ශ්‍රේණියට උසස් වී වසර තුන (03) ක් ගතවීමට පෙර | ලිඛිත/වාචික සහ ප්‍රායෝගික පරීක්ෂණයකි - උපලේඛණ 2 |
| 3 වන කාර්යක්ෂමතා කඩඉම | I ශ්‍රේණියට උසස් වී වසර පහ (05) ක් ගතවීමට පෙර | ලිඛිත පරීක්ෂණයකි - උපලේඛණ 3 |

8.2 කාර්යක්ෂමතා කඩඉම පවත්වනු ලබන කාලසීමාව : වර්ෂයකට දෙවරක්

8.3 කාර්යක්ෂමතා කඩඉම්වලට අදාල පරීක්ෂණ පවත්වනු ලබන බලධරයා :

| | |
|---|---|
| 1 වන කාර්යක්ෂමතා කඩඉම<br>2 වන කාර්යක්ෂමතා කඩඉම<br>3 වන කාර්යක්ෂමතා කඩඉම | රේඛීය සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් |

8.4 කාර්යක්ෂමතා කඩඉම් විභාග විෂය නිර්දේශය :

(අ).

| එක් එක් බඳවා ගැනීම් පරිපාටිය යටතේ අනුරූපී වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයේ විෂයයන් | |
|---|---|
| පැරණි බඳවාගැනීම් පරිපාටිය | නව බඳවාගැනීම් පරිපාටිය |
| (1).I කාර්යක්ෂමතා කඩඉම් විභාගය හා දෙපාර්තමේන්තු පරීක්ෂණය<br>• විෂය ක්ෂේත්‍රයට අදාල (ලිඛිත,වාචික,ප්‍රායෝගික)<br>• ආයතන සංග්‍රහය හා මුදල් රෙගුලාසි | (1).I කාර්යක්ෂමතා කඩඉම් විභාගය<br>• ආයතන සංග්‍රහ හා කාර්ය පටිපාටික රීති<br>• මුදල් රෙගුලාසි |
| (2).II කාර්යක්ෂමතා කඩඉම් විභාගය<br>• විෂය ක්ෂේත්‍රයට අදාල ප්‍රශ්න පත්‍රය<br>• කාර්යාල පරිපාලනය,ආයතන සංග්‍රහය හා මුදල් රෙගුලාසි | (2).II කාර්යක්ෂමතා කඩඉම් විභාගය<br>• විෂයානුබද්ධ (ලිඛිත,වාචික,ප්‍රායෝගික)<br>• ආයතන සංග්‍රහය<br>• මුදල් රෙගුලාසි |
| | (3).III කාර්යක්ෂමතා කඩඉම් විභාගය<br>• විෂයානුබද්ධ (බහුවරණ)<br>• විෂයානුබද්ධ (ව්‍යුහගත රචනා) |

(ආ). පැරණි බඳවා ගැනීමේ පරිපාටිය අනුව පළමු කාර්යක්ෂමතා කඩඉමෙහි ආයතන සංග්‍රහය හා මුදල් රෙගුලාසි විෂය සමත් නිලධාරීන් මෙම බඳවාගැනීම් පරිපාටිය අනුව පළමු කාර්යක්ෂමතා කඩඉමෙන් නිදහස් කිරීම.

(ඇ). මෙම බඳවා ගැනීමේ පරිපාටිය බලාත්මක වන දිනට පෙර පැවති බඳවා ගැනීම් පරිපාටිවල විධිවිධාන යටතේ දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් සමත් විය යුතු නිලධාරීන් , පැවති බඳවා ගැනීම් පරිපාටියට අනුව දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයේ එක් එක් විෂයන්ට අනුරූපී වන මෙම බඳවා ගැනීම් පරිපාටිය යටතේ පැවැත්වෙන දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයේ විෂය සමත්වීමෙන් දෙවන කාර්යක්ෂමතා කඩඉම සම්පූර්ණ කල යුතුය.අනුරූපී විෂයයන් ඉහත සඳහන් වගුවෙහි දැක්වේ. පැරණි බඳවා ගැනීම් පරිපාටිය අනුව දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් අනුරූපී විෂයන් සමත් වී ඇත්නම් එම විෂයන් පමණක් නව බඳවා ගැනීම් පරිපාටිය යටතේ සමත්වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කරනු ලැබේ.

(ඉ).නව බඳවාගැනීමේ පරිපාටිය බලාත්මක වන දිනට I වන ශ්‍රේණියේ වසර 05 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරීන් සඳහා තුන්වන කාර්යක්ෂමතා කඩඉම සමත්වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කරනු ලැබේ.

(ඊ). මෙහි උපජේද අංක (ඇ) හි සඳහන් පරිදි සමත් විය යුතු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය වෙනස් වුවද, සමත් විය යුතුව තිබූ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයට අදාල කාලසීමාව වෙනස් නොවේ.

**9. භාෂා ප්‍රවීණතාව**

9.1.

| භාෂාව | ලබාගත යුතු ප්‍රවීණතාව |
|---|---|
| 01.රාජ්‍ය භාෂාව | රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යයකින් සේවයට බැඳුනු නිලධාරිණියන් විසින් නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය පරිවාස කාලය තුලදී ලබාගත යුතුය. |
| 02.අනෙක් රාජ්‍ය භාෂාව | රා.පරි.චක්‍රලේඛ/1/2014 හා ඊට අනුෂාංගික චක්‍රලේඛ අනුව නියමිත මට්ටමේ ප්‍රවීණතාවය ලබාගත යුතුය. |

**10.ශ්‍රේණි උසස් කිරීම්:**

10.1. III වන ශ්‍රේණියේ සිට II වන ශ්‍රේණියට උසස් කිරීම:

10.1.1.සපුරාලිය යුතු සුදුසුකම් :

i. පත්වීම ස්ථිර කර තිබීම.

ii. නිලධාරී ගණයේ III වන ශ්‍රේණියේ අවම වශයෙන් වසර දහය (10) ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා නියමිත වැටුප් වර්ධක දහයක් (10 ක්) උපයාගෙන තිබීම සහ උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර දහය (10) ක් තුල සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහල කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

iii.උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුල සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

iv.අදාල මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබාගෙන තිබීම.

v. අදාල කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත් වී තිබීම.

10.1.2.උසස් කිරීමේ ක්‍රමය :

සුදුසුකම් සම්පූර්ණ කරන නිලධාරිණියන් II වන ශ්‍රේණියට උසස් කිරීම සඳහා වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අදාල නිලධාරිණිය විසින් ඇමුණුම් අංක 01 ට අනුව ඉල්ලීමක් කරනු ලැබූ විට ,සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි උසස් කිරීම සිදු කරනු ලැබේ.

2019.12.30
වයඹ ආණ්ඩුකාරවර ලේකම්
දිනය: 2019.12.31

10.2. II වන ශ්‍රේණියේ සිට I වන ශ්‍රේණියට උසස් කිරීම.

10.2.1.සපුරාලිය යුතු සුදුසුකම් :

i. නිලධාරි ගණයේ II වන ශ්‍රේණියේ අවම වශයෙන් වසර දහය (10) ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා නියමිත වැටුප් වර්ධක දහයක් (10) ක් උපයාගෙන තිබීම සහ උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර දහය (10) ක් තුල සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

ii. උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

iii.අදාල කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත් වී තිබීම.

10.2.2.උසස් කිරීමේ ක්‍රමය :

සුදුසුකම් සම්පූර්ණ කරන නිලධාරිණියන් I වන ශ්‍රේණියට උසස් කිරීම සඳහා වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඇමුණුම් අංක 02 ට අනුව ඉල්ලීමක් කරනු ලැබූ විට, සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි උසස්වීම් සිදු කරනු ලැබේ.

10.3. I වන ශ්‍රේණියේ සිට අධිශ්‍රේණියට උසස් කිරීම.

10.3.1.සපුරාලිය යුතු සුදුසුකම් :

i. නිලධාරි ගණයේ I වන ශ්‍රේණියේ අවම වශයෙන් වසර දහය (10)ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා නියමිත වැටුප් වර්ධක දහය (10) ක් උපයාගෙන තිබීම සහ උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර (10) ක් තුල සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහල කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

ii. උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුල සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

iii. අදාල කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත් වී තිබීම.

10.3.2.උසස් කිරීමේ ක්‍රමය :

සුදුසුකම් සම්පූර්ණ කරන නිලධාරිණියන් අධි ශ්‍රේණියට උසස් කිරීම සඳහා වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඇමුණුම් අංක 03 ට අනුව ඉල්ලීමක් කරනු ලැබූ විට සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි උසස්වීම් සිදු කරනු ලැබේ.

සංලක්ෂය : ශ්‍රේණි වලට උසස් කිරීමේදී නියමිත දිනට කාර්යක්ෂමතා කඩඉම් සමත් වීමට ප්‍රමාද වූ කාලයට සමාන කාලයකින් උසස්වීමේ දිනය ප්‍රමාද කළ යුතුය.

11. තනතුරුවලට පත් කිරීම.

පත්කිරීම් බලධාරියා : වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්

11.1.සුදුසුකම්:

| තනතුර | සුදුසුකම් | තෝරා ගනු ලබන ආකාරය |
|---|---|---|
| පරිපාලන පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිණී | i. පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිණී තනතුරෙහි ස්ථිර කරන ලද නිලධාරිණියක විය යුතුය.<br><br>ii. පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිණී තනතුරේ I ශ්‍රේණියට අයත් නිලධාරිණියක විය යුතුය.<br><br>iii. අයදුම්පත් කැඳවන අවසාන දිනට පූර්වාසන්න වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම. | අභ්‍යන්තර නිවේදන මගින් අයදුම්පත් කැඳවා සුදුසුකම් ලත් අයදුම්කාරියන් පහත සඳහන් ලකුණු දීමේ ක්‍රමය පදනම් කර ගනිමින් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් තෝරා ගැනේ.<br><br><u>ලකුණු දීමේ ක්‍රමය</u><br><br>උපලේඛන 4 න් දැක්වේ. |

I ශ්‍රේණියේ නිලධාරීන් නොමැති විට II ශ්‍රේණියේ නිලධාරීන්ද, I හෝ II ශ්‍රේණියේ නිලධාරීන් නොමැති විට III ශ්‍රේණියේ නිලධාරීන්ද මෙම තනතුරට පත් කරනු ලැබේ.

සටහන -

01.ඉහත වගුවල දැක්වෙන ලකුණු ලබාදෙන නිර්ණායකයන් සඳහා වෙන් කර ඇති උපරිම ලකුණු ප්‍රමාණයන් ඇතුළත්, එක් එක් යෝග්‍යතාවය ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා සවිස්තරාත්මක ලකුණු පරිපාටිය උපලේඛණ 4 හි සඳහන් කර ඇත.

02.අයදුම්කරුවන් සියලුදෙනාම සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයෙන් ලබා ගන්නා මුළු ලකුණුවල කුසලතා අනුපිළිවෙල අනුව හා පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව අයදුම්කරුවන් පරිපාලන පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනී තනතුර සඳහා පත්කරනු ලැබේ.

පවුල් සෞඛ්‍ය සේවා නිලධාරීන් බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය
විසින්
2019 . 12 . 30 දින

වයඹ ආණ්ඩුකාරවර ලේකම්
දිනය: 2019 . 12 . 31

## 12.ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය

**(බඳවා ගැනීම් පරිපාටිය ක්‍රියාත්මක වන දිනට සේවයේ නියුතු වූවන් සඳහා ) -**

නව බඳවා ගැනීමේ පරිපාටිය ක්‍රියාත්මක වන දිනට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 MT-05 - 2016 වැටුප් පරිමාණයෙහි වැටුප් ලබන පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිණියන් ප්‍රතිසංවිධිත අතුරු වෛද්‍ය සේවයට අන්තර්ග්‍රහණය කිරීම ආයතන සංග්‍රහයේ VII වන පරිච්ඡේදයේ 4 වන වගන්තියේ විධි විධානවලට යටත්ව පහත සඳහන් පරිදි සිදු කරනු ලැබේ.

කෙසේ වුවද අන්තර්ග්‍රහණය හේතුවෙන් අදාල නිලධාරියාගේ වැටුපෙහි හෝ වැටුප් වර්ධක දිනයෙහි වෙනසක් සිදු නොවිය යුතු අතර, එම දිනය අන්තර්ග්‍රහණයට පෙර පැවති වැටුප් වර්ධක දිනය වශයෙන් නොවෙනස්ව ක්‍රියාත්මක විය යුතුය. එසේම වැටුප් පරිවර්තනයේ දී අදාල තැනැත්තා අවසන් වරට ලබමින් සිටි වැටුප් පියවර නව වැටුප් පියවරට අනුරූපී වීම මත ආයතන සංග්‍රහයේ VII වන පරිච්ඡේදයේ 4.4 වගන්තිය අනුව ඊළඟ ඉහළ වැටුප් පියවරේ තැබීම ද නොකල යුතුය.

i. සේවයේ II "ආ" ශ්‍රේණියේ නිලධාරිණියන් නව බඳවා ගැනීමේ පරිපාටියේ III වැනි ශ්‍රේණියට,

ii. සේවයේ II "අ"ශ්‍රේණියේ නිලධාරිණියන් නව බඳවා ගැනීමේ පරිපාටියේ II වැනි ශ්‍රේණියට, සේවයේ II "ආ" ශ්‍රේණියේ සිටියද II ශ්‍රේණියට උසස් වීමට සුදුසුකම් සපුරා ඇති නිලධාරිණියන් II ශ්‍රේණියට ,

iii.සේවයේ I වන ශ්‍රේණියේ නිලධාරිණියන් නව බඳවා ගැනීමේ පරිපාටියේ I වැනි ශ්‍රේණියට ද, සේවයේ II "අ"ශ්‍රේණියේ සිටියද I ශ්‍රේණියට උසස් වීමට සුදුසුකම් සපුරා ඇති නිලධාරිණියන් I ශ්‍රේණියට ,

iv.සේවයේ I වන ශ්‍රේණියේ වසර 10 ක සක්‍රිය සේවා කාලයක් සම්පූර්ණ කර ඇති හා I වන ශ්‍රේණියට නියමිත වැටුප් වර්ධක දහය (10 ) ක් උපයාගෙන ඇති නිලධාරීන් අධි ශ්‍රේණියටද අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

## 13.අන්තර්කාලීන විධිවිධාන

### 13.1.ශ්‍රේණි උසස් කිරීම් සම්බන්ධ විධිවිධාන

ගරු ආණ්ඩුකාරවරයා විසින් පලාත් සභාවට අදාල කරන ලද වෛද්‍ය කර්මය සඳහා වූ පරිපූරක වෘත්තීන්ගේ සේවයේ හා අතුරු වෛද්‍ය සේවයේ I වන ශ්‍රේණියේ උසස්වීම් ලබාදීම යන මැයෙන් ඊජීය අමාත්‍යාංශයේ ගරු අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කරන ලද 2012-03-13 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා 2014-09-04 දින පැවැති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී එළඹ ඇති තීරණය අනුව 2010-11-01 දින සිට 2015-12-31 දින දක්වා අන්තර් කාලය ක්‍රියාත්මක වේ. මෙම අන්තර් කාලය තුල II වන ශ්‍රේණියේ හා I වන ශ්‍රේණියේ උසස්වීම් පහත සඳහන් පරිදි ලබා දෙනු ඇත.

#### 13.1.1. <u>II අ ඛණ්ඩයට / II වන ශ්‍රේණියට උසස් කිරීම.</u>

පුහුණු කාලයද ඇතුළුව II "ආ" ඛණ්ඩයේ /III වන ශ්‍රේණියේ වසර 08 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති හා නියමිත දෙපාර්තමේන්තු පරීක්ෂණය හා කාර්යක්ෂමතා කඩඉම සමත් නිලධාරීන් II "අ" ඛණ්ඩයට/II වන ශ්‍රේණියට උසස් කරනු ඇත.

13.1.2. <u>I වන ශ්‍රේණියට උසස් කිරීම.</u>

II "අ" බණ්ඩයේ /II වන ශ්‍රේණියේ වසර 09 ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සහිත මුල් පත්වීමේ දින සිට අවම වශයෙන් වසර 15 ක සේවා කාලයක් සම්පූර්ණ කරන ලද නිලධාරීන් හිඟ වැටුප් ,අතිකාල දීමනා හා අනෙකුත් දීමනා ගෙවීමකින් තොරව I වන ශ්‍රේණියට උසස් කරනු ඇත.

**14.මෙම බඳවා ගැනීම් පරිපාටියේ විධිවිධාන සලසා නොමැති කරුණු පිළිබඳව වයඹ ගරු ආණ්ඩුකාරතුමාගේ තීරණය අවසන් තීරණය වේ.**

පවුල් සෞඛ්‍ය සේවා නිලධාරීන් බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය
[illegible] විසින්
2019.12.30 දින
[illegible]

වයඹ ආණ්ඩුකාරවර ලේකම්
දිනය: 2019.12.31

සකස් කළේ :..................... 
(විෂය භාර කණිෂ්ඨ මාණ්ඩලික නිළධාරියා)

ඩබ්.එම්.ආර්. ගීතාංජලී විජේපාල
පරිපාලන නිලධාරි
වයඹ පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය
කුරුණෑගල.

නම : ඩබ්.එම්.ආර්.ගීතාංජලී විජේපාල
තනතුර : පරිපාලන නිළධාරී
දිනය :2019/10/31

පරීක්ෂා කළේ:.....................
(විෂය භාර ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිළධාරියා)

අරුණි එස්. ජයවීර
නියෝජ්‍ය අධ්‍යක්ෂ (පරිපාලන)
වයඹ පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය
කුරුණෑගල.

නම : අරුණි එස්.ජයවීර
තනතුර: නියෝජ්‍ය අධ්‍යක්ෂ (පරිපාලන)
දිනය :2019/11/01

නිර්දේශ කර ඉදිරිපත් කරමි.
අත්සන:...................................
(දෙපාර්තමේන්තු ප්‍රධානියා)

නම : වෛද්‍ය එන්.ෆරීඩ්
තනතුර: වයඹ පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ

දිනය :2019/11/01

නිල මුද්‍රාව:

වෛද්‍ය එන්. ෆරීඩ්
පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ
වයඹ පළාත
කුරුණෑගල.

---

යොමු අංකය :වසෞලේ/1/5/15/7

වයඹ පළාත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ,පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනී තනතුර සඳහා යෝජිත මෙම බඳවා ගැනීමේ පරිපාටිය අනුමත කිරීම නිර්දේශ කරමි.

අත්සන:...................................

නම :...........................

තනතුර:ලේකම්,
සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභසාධන,
පරිවාස හා ළමාරක්ෂක සේවා, කාන්තා කටයුතු
සහ සභා කටයුතු අමාත්‍යාංශය

දිනය :2019/11/05

නිල මුද්‍රාව :

කාන්ති වේහැල්ල
ලේකම්
සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුබසාධන,
පරිවාස හා ළමාරක්ෂක සේවා, කාන්තා කටයුතු සහ
සභා කටයුතු අමාත්‍යාංශය (වයඹ)

යොමු අංකය : NWP/CS/AD/9/H/1-14

වයඹ පළාත් සෞඛ්‍ය දෙපාර්තුමේන්තුවේ පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනී තනතුර සඳහා යෝජිත මෙම බඳවා ගැනීමේ පරිපාටිය අනුමත කිරීම නිර්දේශ කරමි.

දිනය: 2019.11.07

අත්සන :.....................
නම :....................................
තනතුර : ප්‍රධාන ලේකම්, වයඹ පළාත

නිල මුද්‍රාව: පී.බී.එම්. සිරිසේන
ප්‍රධාන ලේකම්
වයඹ පළාත.

---

යොමු අංකය: PPSC/AD15/1/6/1/2019

වයඹ පළාත් සෞඛ්‍ය දෙපාර්තුමේන්තුවේ පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනී තනතුර සඳහා යෝජිත මෙම බඳවා ගැනීමේ පරිපාටිය 2019/10/16 දින වයඹ පළාත් සහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලදී

දිනය: 2019.11.28

අත්සන:.....................
නම :....................................
තනතුර: ලේකම්,
වයඹ පළාත් සහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

නිල මුද්‍රාව: ආර්.එම්.ආර්.එම්. රත්නායක
ලේකම්
පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව
වයඹ පළාත.

---

යොමු අංකය :

වයඹ පළාත් සෞඛ්‍ය දෙපාර්තුමේන්තුවේ පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනී තනතුර සඳහා යෝජිත මෙම බඳවා ගැනීමේ පරිපාටිය 2019.12.30 දින වයඹ පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.

දිනය: 2019.12.31

අත්සන :.....................
නම :....................................
තනතුර : ආණ්ඩුකාරවර ලේකම්,
වයඹ පළාත

නිල මුද්‍රාව: